# කාලිංග මාඝට එරෙහි සටනේ දී යාපහු බලකොටුවෙහි පැවති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

කැලේගම ජීනරතන හිමි, වටරක්ගොඩ සුමන හිමි, කරපික්කඩ සෝභිත හිමි
venkelegama@gmail.com

**ප්‍රමුඛ පද**

කාලිංග මාඝ, දෙවන පැරකුම්, යාපහුව, බලකොටුව,

## හැඳින්වීම

රජරට පෙදෙසින් රාජධානි තුරන්වීම සඳහා බලපාන ලද ආසන්නතම හේතුව වන්නේ කාලිංග මාඝ විසින් පොළොන්නරුව ආක්‍රමණය කිරීම ය. මෙම ආක්‍රමණය සම්බන්ධව සාහිත්‍ය මූලාශ්‍රයන් රැසක කරුණු දැක්වී ඇත. ඒ අතර මහාවංසය, පූජාවලිය, නිකායසංග්‍රහය, රාජරත්නාකරය, දළදා සිරිත, රාජාවලිය යනා දී මූලාශ්‍රයන් ප්‍රධාන ය. මහාවංසයෙහි මාඝ ආක්‍රමණය පිළිබඳව දක්වා ඇත්තේ ලංකාවාසී වූ ජනයන්ගේ උත්සන්න පාප කර්මයක් නිසාවෙන් දෙවියන් විසින් මෙරට ආරක්‍ෂා නොකළ හෙයින් විසිහතර දහසක යෝධ සේනාවක් ගෙන කාලිංග දේශයේ සිට පැමිණි මාඝ විසින් මෙරට අල්ලාගන්නා ලද බව ය (මහාවංසය,පරි80,ගාථා52,53,54,55,56,57). පූජාවලිය මේ පිළිබඳව දක්වන්නේ ලංකාවාසීන්ගේ කිසියම් දරුණු වූ අකුසල කර්මයක් හේතුකොටගෙන ලක්දිව මහේශාඛ්‍ය දෙවියන්ගේ උපේක්‍ෂාවක් නිසාවෙන් මාඝරාජ නම් කලිඟු රජු විසිහතර දහසක මළල සේනාවන් ගෙන මෙරටට පැමිණ කඳවුරු නුවර අල්ලා ගන්නා ලද බව ය (පූජාවලිය ,පරි34,පි:784). රාජරත්නාකරයෙහි මෙම ආක්‍රමණය පිළිබඳව දක්වා ඇත්තේ ද ලංකාවාසීන්ගේ කිසියම් දරුණු වූ අකුසලකර්මයක් නිසාවෙන් දෙවියන් මෙරට ආරක්‍ෂා නොකළ බැවින් මාඝ නම් කලිඟු රජු විසිහතර දහසක් දෙමළ බලසෙන් ගෙන මෙරටට පැමිණ රාජ්‍ය පැහැරගෙන අවිචාරයෙන් රාජ්‍ය කළ බව ය (රාජරත්නාකරය,පි:57). දළදා සිරිතෙහි මෙය දක්වා ඇත්තේ "සිරිලක මිත්‍යා දෘෂ්ටි ගන්වා ලෝසසුන් නැසූ මාඝරජය " යනුවෙනි (දළදා සිරිත,පි:69). රාජාවලියෙහි මේ පිළිබඳව දක්වා ඇත්තේ "ලංකා වාසීන්ගේ කිසියම් ධර්මයක් නැති හෙයින් අහේතුකොට පව් පලදෙන හෙයින්...කලිඟු රජ විසිදහසක් මල්ලව සෙනග ගෙන..." යනුවෙනි (රාජාවලිය,පි:212). දශක දෙකකට අධිකව පැවති කාලිංග මාඝ (ක්‍රි:ව 12151236) පාලනය නිසාවෙන් සිංහල පිරිසට පොළොන්නරුව අතහැර

යන්නට සිදුවිය. මාඝ ගේ කෲර පාලනය යටතේ රජරට පැවති සමයේ දී රුහුණේ සහ මායා ප්‍රදේශයේ සිංහල පාලකයින් ගණනාවක් ම සිය ආධිපත්‍ය පැවති ප්‍රදේශ සීමාවන්ගෙන් ආක්‍රමණිකයින් ඈත්කර තැබීමට සමත්ව ඇත. වත්මන් යාපහුව (සුභ පබ්බත) යනුවෙන් හඳුන්වනුලබන පර්වත ස්ථානයෙහි ආරක්ෂක බලකොටුවක් නිර්මාණය කරගෙන එහි සිට සුභ නමැති හමුදා නායකයෙක් මාඝ ගේ සේනා දකුණු දෙසට පැමිණීම වලක්වා එම ප්‍රදේශය ආරක්ෂාකර ඇත. කෙසේ වුව ද, මෙම ආක්‍රමණිකයා පරාජයට පත්කොට පළවාහරිනුලබන්නේ දඹදෙණියෙහි රාජ්‍යත්වයට පැමිණි දෙවන පැරකුම් රජුගේ සමයේ දී ය. මාඝ පරාජය කිරීම සඳහා මෙම රජුගේ සේනා මෙහෙයවා ඇත්තේ කුමණ ස්ථානයක සිට දැයි කිසිදු සාහිත්‍ය මූලාශ්‍රයක දැක්වී නැත්තේ වුව ද ඒ සඳහා යාපහු බලකොටුව භාවිත කොට ඇති බව සිතිය හැකි සාදකයන් පවතී. මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කොට ඇත්තේ මාඝ පරාජය කිරීමේ දී යාපහු ආරක්ෂක බලකොටුහි පැවති වැදගත්කම අනාවරණය කිරීමය.

**අරමුණ**

ඉතිහාසඥයින් හා පුරාවිද්‍යාඥයින් විසින් ඓතිහාසික සිදුවීම් පිළිබඳව තමන්ට ලැබෙන සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාදක මත පිහිටා යම් යම් නිගමනයන්ට එළඹෙති. එසේ වුව ද මෙම මූලාශ්‍රයන් ද්විත්වයෙන් මෙතෙක් අනාවරණය වී නොමැති ඓතිහාසික තොරතුරු විශාල ප්‍රමාණයක් ද පවතී. ඇතැම්විට එවැනි ඓතිහාසික තතු අනාරණය කරගැනීමට උගතුන් විසින් විධිමත් පර්යේෂයන් සිදු නොකිරී ද එවැනි දෑ අනාවරණය නොවීමට හේතු වී ඇත. සාහිත්‍ය මූලාශ්‍රයන්හි දැක්වෙන තතු විමර්ශනය කිරීමේ දී ඒවායෙහි ඍජුව සඳහන් නොවෙන ඇතැම් ඉතිහාස කරුණු පිළිබඳ සහේතුක නිගමනයන්ට එළඹිය හැකිය. සාහිත්‍ය මූලාශ්‍රයන්හි ඍජුව නොදැක්වෙන ඓතිහාසික කරුණු අනාවරණය කිරීම එම මූලාශ්‍ර විමසීන් සිදු කළ හැකි බැව් පෙන්වාදීම මෙම පර්යේෂණයෙහි අරමුණ වෙයි.

**උපන්‍යාසය**

දඹදෙණියෙහි රාජ්‍යත්වයට පත් වූ දෙවන පැරකුම් රජුගේ සමයේ දී පොළොන්නරුව යටත්කොටගෙන සිටි කාලිංග මාඝ නමැති ආක්‍රමණිකයා පරාජයට පත්කළ බැව් ඓතිහාසික සාහිත්‍ය මූලාශයන් රැසක සඳහන්ව තිබේ. ඒවායෙහි දැක්වී ඇත්තේ මෙම දෙපිරිස යුද වැදී ඇත්තේ කලාවැව ආසන්නයෙහි බව ය. දෙවන පැරකුම් රාජ්‍යත්වට පත්ව සිටි දඹදෙණි පුරයේ සිට ඔහුගේ සේනාවන්ට පොළොන්නරුවෙහි සිටි මාඝගේ සේනා කලාවැව සමීපයට පැමිණෙන සමය වනවිට පැමිණිය නොහැකිය. කලා වැව සමීපයේ දී මෙම දෙපිරිස මුණගැසීමටනම් පැරකුම් රජුගේ සේනා ඔහුගේ අණසක යටගේ පැවති යාපහු බලකොටුවෙහි සිට පැමිණිය යුතුවෙයි. එම නිසා දෙවන පැරකුම් රජු මාඝ ට එරෙහි සටනේ දී ප්‍රධාන බලකොටුව වශයෙන් යාපහුව භාවිතකොට ඇති බැව් සිතිය හැකිය.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය ප්‍රධාන වන හෙයින් මහාවංසය, පූජාවලිය, නිකායසංග්‍රහය, රාජරත්නාකරය, දළදා සිරිත, රාජාවලිය යනා දී ප්‍රාථමික මූලාශ්‍රයන් ප්‍රධානව ද්විතීක සාහිත්‍ය මූලාශ්‍ර විමර්ශනය සඳහා පුස්තකාල අධ්‍යයනය සිදුකෙරේ.

### සාකච්ඡාව

තෙවන විජයබාහු රජුගෙන් පසුව ඔහුගේ වැඩිමහලු පුත් දෙවන පරාක්‍රමබාහු කුමරු (ක්‍රි:ව 1236  1270) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමය ලබා දඹදෙණිය මූලික කරගෙන මායා රජයෙහි රාජ්‍යත්වයට පත්විය (මහාවංශය,පරි82,ගාථා2,3,4). පැරකුම් රජු සිංහාසනයට පත්වනවිට රජ රට ප්‍රදේශ, පොළොන්නරුවේ සිට පාලන කටයුතු සිදුකළ මාස ආක්‍රමණිකයාගේ පාලනය යටතේ පැවතිණි. පැරකුම් රජු ඉදිරියේ පැවති පළමු කාර්යය වී ඇත්තේ මෙම ආක්‍රමණිකයා පලවා හැරීම ය. මෙම බලවත් සතුරා මර්දනය කිරීමට මනාව සැලසුම් කරනලද කළමණාකරන ක්‍රමවේදයක් යටතේ සංවිධානය කරගත්තාලද උපායශීලි යුද සැලසුමක අවශ්‍යතාව පැනනැගී ඇත (ලියනගමගේ, 1989,පි:163164).

පැරකුම් රජු විසින් මාස පළවා හැරීම පිළිබඳව මහාවංසය, පූජාවලිය, රාජරත්නාකරය යනා දි මූලාශ්‍රයන්හි කරුණු දක්වී ඇත. මහාවංසය දක්වන ආකාරයට පැරකුම් රජු විසින් සංවිධානය කරනලද සේනාවන් මාසගේ සේනාවන් නැවතී සිටි බලකොටු ස්ථානයන්ට පිවිස එම පිරිස් වෙත විවිධාකාරයෙන් තාඩන පීඩන සිදුකොට ඇත. මහාවංසය මෙය දක්වන්නේ ගුරුළන් විසින් නයින් පෙළන්නා සේ සිංහල යෝධ සෙනවියන් විසින් දෙමළ යෝධ සෙනවියන් පෙළු බව ය. එම පීඩනයන් ඉවසාගත නොහැකි වූ රටේ විවිධ ස්ථානයන්හි නැවති සිටි මාසගේ සේනාවන් පොළොන්නරු නගරය වෙත එක්රැස් වී මෙම උවදුරෙන් බේරීම සඳහා සාකච්ඡා පවත්වා මෙම රට හැරදා යාමට කථිකාකොටගෙන ඇත (මහාවංසය,පරි83,ගාථා12 සිට 26).

පූජාවලිය දක්වන ආකාරයට මෙලෙස පෙළොන්නරු නගරයට එක්වූ මාස හමුදාවන් ඇත්, අස්, මුතු, මැණික්, රජ වොටුණු (ඔටුණු), බිසෝවරුන් ආදී වූ මාහැගි දේ රැගෙන මෙරටින් නික්මීම පිණිස යන ගමනේ දී නැගෙණහිරදිග වාසල යැයි සිතා වැරදීමකින් බටහිරදිග වාසලින් නික්මී ඇත. එලෙස පලායන මාස හමුදාවන් රට මැද පැවති මහකළුවෙල දී (කලාවැව) සිංහල හමුදාවන්ට හසුව ඔවුන් සතුව පැවති සියලු ම වස්තුව සිංහල හමුදාවන්ට පවරා දී ඔවුන් අතින් ජීවිතක්ෂයට පත්ව ඇත (මහාවංසය,පරි83, ගාථා 3031) (පූජාවලිය,පි:790) (රාජරත්නාකරය,පි:61).

මහාවංසය හා පූජාවලිය තුළ දක්වෙන කරුණු පිළිබඳව විමසීමේ දී පැරකුම් රජු මාස හා අවසන් සටනට සිය සේනාව මෙහෙයවන්නට යෙදුනේ යාපහුව බලකොටුව කේන්ද්‍රකරගෙන යැයි සිතිය හැකිය. මෙම සමය වනවිට සුභ සෙන්පතිවරයා විසින් ගොඩනලන ලද යාපහුව බලකොටුව පැරකුම් රජු යටතේ නිශ්චිත වශයෙන් ම පැවති තිබේ. ඒ බව වංසකතාවෙහි දක්වෙන තතු ඇසුරින් පැහැදිලිවේ. පැරකුම් රජු ජීවත්ව සිටිය දී ම සිය වැඩිමහලු පුත් විජයබාහු කුමරුට පාලන කටයුතු භාරකළ අතර විජයබාහු කුමරු විසින් සිය සොයුරු භුවනෙකබාහු කුමරු යොදවා ආරක්ෂාව අතින් ඉතා වැදගත් උතුරු ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා යාපහුවෙහි ආරක්ෂා සංවිධානය තරකරවන ලද බැව් වංසකතාවෙහි දක්වී ඇත. ඉන් පැහැදිලිවන්නේ පැරකුම් රජුගේ ආධිපත්‍ය යටතේ යාපහුව පැවති බව ය (මහාවංසය,පරි 88, ගාථා 23,24,25)

ඒ අනුව මාස රජුගේ සේනාවන් කළාවැව ආසන්නයේ කොටුකරගැනීමේ කටයුත්තේ දී සේනාව මෙහෙයවීම සඳහා යාපහු බලකොටුව ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් භාවිත කර ඇති බව සිතිය හැකිය. ඒ පිළිබඳව කිසිදු ලිඛිතමය මූලාශ්‍රයක දැක්වී නැත්තේ වුවද යුද්ධය හා බැඳුණු සෙසු කරුණු පිළිබඳව සැලකිලිමත් වීමේ දී මාස රජුගේ හතළිස් දහසක්වන දෑවැන්ත සේනාවට එරෙහිව සිංහල රජු ද විශාල සේනාවක් සංවිධානය කළයුතුව

පැවති නිසා දඹදෙණි පුරයේ සිට කළාවැව දක්වා එවැනි සේනාවක් මෙහෙයවීම දුෂ්කරය. එසේ ම හදිසි අවස්ථාවක් ඇතිවුවහොත් සේනාවට පසුබැසීමට ආරක්ෂක මධ්‍යස්ථානයක් ද අවැසිවන නිසාවෙන් කලාවැවට ආසන්නව පැවති යාපහුව ඒ සඳහා සුදුසුම ස්ථානය වශයෙන් මෙම යුද්ධය සඳහා ප්‍රධාන බලකොටුව ලෙසින් භාවිතයට ගන්නට ඇතැයි සිතීම සහේතුක ය. යුද්ධයට සූදානම්වන අවධියේ දී යාපහුවෙහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා භුවනෙකබා කුමරු එහි රඳවන්නට ඇත්තේ ද යුද්ධයක දී මෙම ස්ථානය ප්‍රයෝජනවත් වනු ඇතැයි යන අපේක්ෂාවෙන් වියයුතුය.

මෙය තහවුරු කරගතහැකි තවත් කාරණයක් වශයෙන් ඈත අවධිවල සිට ම මහා සංඝරත්නය හා රජවරුන් අතර පැවති දෘඩ සම්බන්දය ද දැක්විය හැකිය. දේවානම්පියතිස්ස රජුගේ කාලයේ සිට ම අතළොස්සක් දෙනෙකු හැරෙන්නට මෙරට සිටි බොහෝමයක් රජවරු මහාසංඝරත්නයේ උද්යෝගීමත් අනුග්‍රාහකයින් බවට පත්ව ඇත. රට වැසියන් වෙත විවිධ අයුරින් බලපෑම් සිදුකිරීම සඳහා භික්ෂූන්වහන්සේලා සතු වූ හැකියාව රජවරුන් විසින් සිය දේශපාලන තත්ත්වය ස්ථාවර කරගැනීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති බව ඉතිහාසගත තතු පිරික්සීමේ දී පෙනී යයි. මහාවංසය, අස්ගිරිතල්පත ඇතුළු ඇතැම් සාහිත්‍ය මූලාශ්‍රයන් විස්තර කරන පරිදි සුභ සෙන්පතිවරයාගේ රැකවරණය පතා යාපහුවට පැමිණි වසලස්ගල වන සෙනසුන ආරම්භ කළ දිඹුලාගල දීපංකර හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා වලස්ගල නමැති ස්ථානයේ මෙම සමය වනවිට ද වාසය කළ බවත් එම ස්ථානය භික්ෂූ ආරාමයක් වශයෙන් කුරුණෑගල රාජධානි අවධිය වනවිටත් ක්‍රියාකාරව පැවති බවත් පෙනී යයි (අස්ගිරිතල්පත,පි:5621).

මෙම භික්ෂූ පිරිසට දිඹුලාගල අතහැර පැමිණීමට සිදුවූයේ මාඝගේ ආක්‍රමණය නිසාවෙන් වන බැවින් මාඝ පළවාහැරීමේ අවශ්‍යතාවය උන්වහන්සේලා වෙත ද පවතින්නට ඇත. එම නිසාවෙන් මෙම පිරිස මාඝ විරෝධී සටනේ අනුග්‍රාහකයින් බවට පත්ව දෙවන පැරකුම් රජුට උපකාර කරන්නට ඇත. යාපහුව ප්‍රදේශය ආශ්‍රිතව රජුගේ බලය පිළිගත් යටත් වැසියන් පිරිසක් ඇතිකොට රජුගේ හමුදාවට අවැසි භට පිරිස් සංවිධානය කිරීමට වලස්ගල වැසි භික්ෂූන් විසින් නොමඳ සහයක් ලබාදෙන්නට ඇති බව විස්වාස කළ හැකිය. මෙම කරුණ නිසා යාපහු ප්‍රදේශය ආශ්‍රිතව වැඩ සිටි භික්ෂූන්වහන්සේලා වෙතින් ලද සහය හේතුවෙන් දෙවන පැරකුම් රජුට මාඝ විරෝධී සටන සඳහා යාපහුව ශක්තිමත් බලකොටුවක් වශයෙන් භාවිතයට ගැනීමට මග සැලසෙන්නට ඇතැයි සිතිය හැකිවීම සහේතුකය.

එමෙන් ම විජයබාහු රජු විසින් සිය වැඩිමහලු මළනුවන් වන භුවනෙකබාහු ඈපාණන්ට යාපහු බලකොටුව ප්‍රධාන මුරකාවල වශයෙන් පවත්වාගෙන රටේ උතුරු පෙදෙස ආරක්ෂාකිරීමේ කටයුත්ත පවරා ඇත. මහාවංසයෙහි මෙම පත්කිරීම පිළිබඳව දක්වා ඇත්තේ මෙම පෙදෙසින් සතුරන් බොහෝ සෙයින් ගොඩ බසින බැවින් බොහෝ සෙයින් යුද්ධ මෙම ප්‍රදේශය තුළ සිදුවන නිසාවෙන් මෙම පෙදෙස ආරක්ෂා කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ මෙම කුමරු බව සලකා මෙම පත්වීම සිදුකර ඇති බවය. එසේම යාපහුව බලකොටුව තුළ විශාල හමුදාවක් ද භුවනෙකබා කුමරුන් සමග රැඳවීමට ද විජයබා රජු ක්‍රියාකොට ඇත (මහාවංශය,පරි88, ගාථා23,24,25.26). මින් පැහැදිලි වන්නේ යාපහු බලකොටුව තුළ විශාල සේනාවකට පහසුවෙන් ජීවත්ව සිටියහැකි වන පරිදි භුවනෙකබා කුමරු විසින් කටයුතු යොදා පැවති බවය.

CS CamScanner

## පරිශීලන නාමාවලිය


- අස්ගිරි තල්පත, (1997), සංස්. රෝහණදීර, මැන්දිස්, කර්තෘ ප්‍රකාශන, තරංජි ප්‍රින්ට්ස්, මහරගම..
- දළදාසිරිත, (2000), සංස්. ගුණවර්ධන, වී.ඩී.එස්, සමයවර්ධන පොත්හල, කොළඹ 10.
- පූජාවලිය, සංස් .ඥානවිමල හිමි, කිරිඇල්ලේ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2004.
- මහාවංශය, (2006) සංස් සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ පඬිතුමා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
- රාජරත්නාකරය, (2011) සංස් තිලකසිරි, සිරි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
- රාජාවලිය, (1971), සංස්. සුරවීර, ඒ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.